සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## නාට්‍ය හා රංගකලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- 1 සිට 6 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු පහත ගායනා ඇසුරෙන් සපයන්න.

A - වැඩ ඇති විට අතපසු නොකරන්නේ
අද දවසට වැඩ අද කරපන්නේ
හෙට දවසට හෙම කල් නොදමන්නේ
නිසි කාලෙට නිසි වැඩ කරපන්නේ

B - කටේ කිරි සුවඳ යන්නට පවා බැරි වුනා
යුදට උපන් කුමරා යැයි නමක් පැවතුනා

C - අහසින් අවුත් මණිඅක් නයිඳු යැදුමට
රහතන් මැදෙහි මුණි හිඳ මිණි පළඟ පිට

D - සුවඳ පද්ම ඕලු ආදි නොයෙක පුෂ්පයෙන් සැදී
සරණ හංස සේරු බෝම පොකුණු සීත පැන් පිරී

E - කිරි බොනකොට පුංචි යාළු - උගුර උගුර අපට දේලු
බංඩි ගෙඩිය පිරෙනවා - අපි සෙල්ලම් කරනවා

01) සිරිත් මල් දමෙහි ඇතුළත් ගීතය අඩංගු වන අක්ෂරය වන්නේ,

1. C 2. D 3. A 4. B

02) "අමර ගියා දිව්‍ය ලෝකෙ" නාට්‍යයේ ගීතය වන්නේ,

1. A 2. C 3. D 4. E

03) 'C' අක්ෂරයේ ඇති ගායනයෙන් කියවෙන්නේ,

1. යක්ෂ නාග යුද්ධය යි.
2. කැළණි වෙහෙර ඉදි වූ ආකාරයයි.
2. චූලෝදර මහෝදර කතාවයි.
3. අහසින් වැඩි රහතන් වහන්සේලා ගැනයි.

04) "නූර්ති ගීයක්" වන්නේ,

1. D 2. A 3. E 4. B

05) ඓතිහාසික සිද්ධි පදනම් කරගත් ගායනා ඇතුළත් වන්නේ,

1. AB 2. CD 3. BC 4. BD

06) උපදේශාත්මක ගායනයක් වන්නේ

1. A 2. B 3. C 4. E

- **අංක 07 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

07) "අභිනය" ගණනින්.

1. 5 කි. 2. 4 කි. 3. 6 කි. 4. 2 කි.

08) ඇඟ සැහැල්ලු කරගැනීම සඳහා කරනු ලබන අභ්‍යාස වන්නේ,

1. පරිකල්පන අභ්‍යාස 2. ස්වසන අභ්‍යාස.
2. තාපන අභ්‍යාස 4. ශිථිලකරණ අභ්‍යාස

09) "අමර ගියා දිව්‍ය ලෝකෙ" නාට්‍යයේ තේමාව වන්නේ,

1. වැරදි මතයක සිටි දරුවෙකු උපක්‍රමශීලීව නිවැරදි මඟට ගැනීම.
2. දිව්‍ය ලෝකයේ සැප සම්පත් නැති බව.
3. ළමයින්ට වඩා සත්තු හොඳ බව.
4. අමර නරක දරුවෙකු බව.

10) "වාචික අභිනය" නොමැතිව කරන නිරූපනයකි,

1. ඒකල නිරූපන. 2. ක්‍ෂණික නිරූපන. 3. චරිත නිරූපන. 4. අභිරූපන.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල ඇති හිස්තැන් වරහන් තුළ දී ඇති වචන යොදා සම්පූර්ණ කරන්න.**

(රංග භූමිය, සිරිංජරය, ශිථිලකරණ, වේෂ භූෂණ, සුරංගනාවන්)

11) හිමකන්ද දියවීම .................................. අභ්‍යාසයකි.

12) නාට්‍ය සඳහා යොගන්නා ඇඳුම් පැළඳුම් .................................. නමින් හඳුන්වයි.

13) .......................................... අමර ගියා දිව්‍ය ලෝකෙ නාට්‍යයේ ඇති නාට්‍යෝපකරණයකි.

14) කමත ...................................... ක් ලෙසද යොදාගනී.

15) ...................................................... අධි මානුෂ චරිත ලෙස ගැනේ.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 16) ශාස්ත්‍රකාරිය. | 1. වේෂ භූෂණ |
| 17) වෙද පුටුව. | 2. නාට්‍ය පෙළ. |
| 18) ඔටුන්න. | 3. ශ්‍රව්‍ය මාධ්‍ය |
| 19) ගුවන් විදුලිය | 4. ක්‍ෂණික නිරූපන |
| 20) රංග විධාන. | 5. පරිකල්පන අභ්‍යාස |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

01) 1. අමර ගියා දිව්‍ය ලෝකෙ නාට්‍යය කාගේ නිර්මාණයක්ද? (ල. 02)
2. එහි එන ඔබ සිත් ගත් චරිතය නම් කරන්න. (ල. 02)
3. අමර හොඳ මඟට ගැනීම සඳහා උපක්‍රමය යොදන්නේ කවුද? (ල. 02)
4. අමර දිව්‍ය ලෝකෙ යන්න හිතන්නේ ඇයි? (ල. 02)
5. ඔබ දන්නා වෙනත් ළමා නාට්‍ය දෙකක් නම් කරන්න. (ල. 02)

02) 1. "අභිනය" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න. ල. 02)
2. අභිනයේ ප්‍රභේද කීයද? ඒ මොනවාද? (ල. 04)
3. සතර අභිනයෙන් එක් අභිනයක් විස්තර කර දක්වන්න. (ල. 04)

03) 1. වේදිකා නාට්‍ය සඳහා භාවිතා වන විවිධ කලා ප්‍රභේද මෙනවාද? (ල. 03)
2. රංග භාණ්ඩ, වේෂ භූෂණ, නාට්‍ය සංගීතය, නාට්‍ය ගීත, නර්තන රටා ගමන් විලාශ යන අංග කලා ප්‍රභේද වලට වෙන්කර දක්වන්න. (ල. 03)
3. පංති කාමරයේදී ඔබ සකස් කරන ලද වේෂ භූෂණයක පින්තූරයක් ඇඳ එය සකස් කිරීමට ගත් අමුද්‍රව්‍ය හා එය සකස් කළ ආකාරය විස්තර කරන්න. (ල. 04)

04) 1. අභිරූපනය යන්නෙන් හඳුන්වන්නේ කුමක්ද? (ල. 03)
2. අභිරූපනයේදී යොදා නොගන්නා අභිනය කුමක්ද?. (ල. 03)
3. අභිරූපන රංගයක් හා සාමාන්‍ය රූපනයක් අතර වෙනස්කම් දෙකක් ලියන්න (ල. 04)

05) 1. පහත සඳහන් ඉඟිය ඇසුරු කරගෙන නාට්‍යයකට සුදුසු පෙළක් රචනා කරන්න.
සිඳීගෙන යන විලක් - මාළුවෝ දෙන්නෙක් - කකුළුවෙක් - කොක්කු දෙන්නෙක්

1. චරිත සංවාද සහිත පෙළ නිර්මාණය සඳහා (ල. 05)
2. කුතුහලය, ගැටුම හා නිමාව සහිත පෙළ නිර්මාණය. (ල. 05)

(4) WWW.PastPapers.WiKi (3)
Download Term Test Papers, Short Notes From One Place!

(4) WWW.PastPapers.WiKi (4)

Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## නාට්‍ය හා රංගකලාව – පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය:

### I - කොටස

| | | | |
|---|---|---|---|
| 1 - 3 | 6 - 1 | 11 - ශිථිලකරණ | 16 - 4 |
| 2 - 4 | 7 - 2 | 12 - වේෂ භූෂණ | 17 - 5 |
| 3 - 2 | 8 - 4 | 13 - සිරිංජරය | 18 - 1 |
| 4 - 1 | 9 - 1 | 14 - රංග භූමිය | 19 - 3 |
| 5 - 3 | 10 - 4 | 15 - සුරංගනාවන් | 20 - 2 |

### II - කොටස

01) i. පාලිත ලොකු පෝතාගම මහතා (ල 02)

ii. අමර, අම්මා, බල්ලා, පූසා, දොස්තර මාමා, සුරංගනාවන්.... ආදී චරිතයන් සඳහා (ල 02)

iii. දොස්තර මාමා. (ල 02)

iv. ඉස්කෝලේ යන්න නැති නිසා, ඉගෙන ගන්න කම්මැලි නිසා... ආදී එම අදහස දෙන වෙනත් පිළිතුරක් සඳහා. (ල 02)

v. හිමකුමරි, තොප්පි වෙළෙන්දා, පුංචි අපිට දැන් තේරෙයි. ආදී නාට්‍ය 02 සඳහා (ල 02)

02) i. අභි - ඉදිරියට, නය - පැමිණවීම යන අදහස අභිනය යන්නෙන් අදහස් කෙරේ. (ල 02)

ii. 4 යි

| | |
|---|---|
| ආංගික අභිනය | සාත්වික අභිනය |
| වාචික අභිනය | ආහාර්ය අභිනය (ල 04) |

iii. 1. ආංගික අභිනය - අඟ පසඟ සොලවා අදහස් ප්‍රකාශ කිරීම.

2. වාචික අභිනය - වචන උපයෝගී කරගෙන අදහස් ප්‍රකාශ කිරීම

3. සාත්වික අභිනය - මුහුනේ උපාංග චලනයෙන් අදහස් ප්‍රකාශ කිරීම.

4. ආහාර්ය අභිනය - වේදිකාවට බැහැරින් ගෙන එන වේෂ භූෂණ, රංගාලෝකය, රංග භාණ්ඩ, පසුතල නිර්මාණ ආදිය උපයෝගී කරගෙන අදහස් ප්‍රකාශ කිරීම... ආදී වශයෙන් එක් අභිනයක් විස්තර කිරීම සඳහා (ල 04)

03) i. චිත්‍ර, නර්තන, සංගීතය. (ල 03)

ii. චිත්‍ර - රංග භාණ්ඩ, වේෂ භූෂණ

නර්තන - නර්තන රටා, ගමන් විලාශ.

සංගීත - නාට්‍ය සංගීතය, නාට්‍ය ගීත (ල 03)

iii. සකස් කිරීමට ගත් අමුද්‍රව්‍ය සඳහන් කිරීමට - ල 01

පින්තූරය ඇඳීමට (ඔටුනු, ඉණහැඩ... ආදී) - ල 01 — ල.04

හදන අයුරු විස්තර කිරීමට - ල 02

(2) www.PastPapers.WiKi (1)



Download Term Test Papers, Short Notes From One Place!

04) i. වචන භාවිතයෙන් තොරව මිනිස් සිරුර උපයෝගී කරගෙන කිසියම් සිද්ධියක් අතිශයෝක්තියෙන් යුතුව නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම (ල 03)

ii. වාචික අභිනය (ල 03)

iii. 1. වාචික අභිනය භාවිතා නොකිරීම.

2. උපකරණ භාවිතා නොකිරීම.

3. ආංගික හා සාත්වික අභිනය වැඩිපුර යොදා ගැනීම.

4. ස්වභාවිකත්වයෙන් තොර වීම.

5. රිද්මයානුකූල බවක් තිබීම. .... ආදී කරුණු 02ක් සඳහා (ල 04)

05) i. දී ඇති ඉඟිය පාදක කරගෙන චරිත සංවාද සහිත පෙළ නිර්මාණය සඳහා. (ල 05)

ii. කුතුහලය, ගැටුම හා නිමාව සහිත පෙළ නිර්මාණයට. (ල 05)

PAST PAPERS WIKI

(2) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න